3 වන පිටෙන්

ජීවිතයක් ගතකරන මෙබඳු ශ්‍රමන පිරිස් පොදු සමාජයේ ගෞරවය දිනාගත්හ.බෞද්ධ භික්ෂූන් යනු එලෙස පරිනාමය වූ ශ්‍රමන සංස්ථාවකි. .

මුල් බුදු දහමේ උක්ත පරමාර්ථය සහ වර්තමාන ලාංකීය සංඝ සංස්ථාවේ ස්වභාවය අතර තිබෙන සම්බන්ධතාවය කෙසේ වුවද අතිශය දුරස්ථය. මෙරට මුල සිටම භික්ෂූන් අතර වනවාසී හා ග්‍රාමවාසී ලෙස විභේදනයක් පැවැති අතර මුල් බුදු දහමේ පරමාර්ථය සමග සම්පත්වයක් දැක්වී යැයි කිව හැක්කේ වනවාසී සම්ප්‍රදායයි. ලෞකික සමාජයේ තවත් එක් ආයතනයක් ලෙස තහවුරු වූ අනෙත් සම්ප්‍රදාය නොවැලැක්විය හැකි ලෙසම සමාජයේ සිදුවන වෙනස්කම් වලට අනුව හැඩගැසෙමින් සමාජයට අනුකූලව පරිනාමය වී තිබේ.මුල් බුදු සමය තුල කුලභේදයට පැවැති විරෝධයත් මෙරට ස්ථාපිත භික්ෂු සංස්ථාව තුල කුලභේදයට පවතින අනුබලයත් සැලකූ විට බෞද්ධ සංස්ථාව සමාජයට අනුව හැඩගැසී තිබෙන ආකාරය මනාව හදුනාගත

*ජාතිවාදී හා ආගම්වාදී වහසි බස් දොඩන මන්ත්‍රී භික්ෂූන් වනාහි කුනු වී ගිය පොදු සමාජයේම පැතිකඩකි. වෙනෙකක් තබා පාර්ලිමේන්තුවද මිනීමරුවන්ගේ, මත්කුඩු වෙලෙන්දන්ගේ හා අවස්ථාවාදීන්ගේ පල් වලකි.*

හැකි ය.

මේ නිසා වර්තමාන භික්ෂු සංස්ථාව අතීත ඉන්දියාවේ මෙන් සමාජයෙන් බැහැරට ගොස් විමුක්තිය සොයන්නවුන්ගේ නිදහස් එකතුවකට වඩා සමාජය සමග බද්ධ වී තිබෙන ලෞකික සමාජයේම තවත් අංගයක් ලෙස සැලකීම වඩා නිවැරදිය. නිවන් දැකීමත් මහනකමත් අතර අති බහුතරයක් භික්ෂූන්ට ඇත්තේ අල්ප සම්බන්ධයක් බව අතිශයෝක්තියක් නොවේ. ළමා මහනකිරීම් රට තුල බහුලව සිදුවන අතර එලෙස මහන කෙරෙන කුඩා දරුවෙකු බොහෝවිට භික්ෂුවක ලෙස උස්මහත් වනුයේ එසේ ජීවත් වන්නට ඔහුට නියම වූ නිසාය. බීබීසී සිංහල සේවය වාර්තා කරන පරිදි පසුගිය දශකය තුල භික්ෂූන් 110 නමකට එරෙහිව ළමා අපචාර චෝදනා ගොනු වී තිබේ.

බොහෝ නාගරික පන්සල් මහා පරිමාන වානිජ මධ්‍යස්ථාන බවට පත්ව ඇත.පිටිදූවේ සිරිධම්ම හිමි වැනි අය බන කීම උදෙසා විවිධ වටිනාකම් සහිත මුදල් පැකේජ සම්පාදනය කර තිබේ.ටියුශන් දීම,ශාස්ත්‍ර කීම, බිස්නස් කිරීම සදහා භික්ෂූන් විශාල වශයෙන් පෙලඹී ඇති අතර ශ්‍රද්ධාවන්තයන්ට මේවා හෘදයාබාධ ඇතිකරීමට තරම් බරපතල සිදුවීම් වුවද මෙහි ඇති අමුත්තක් නැත.සංඝ සංස්ථාව පෙර කී පරිදිම සමාජයේ තවත් එක් ආයතනයක් වන හෙයින් සමාජය වෙලදපොලකරනය වනවිට,කුනුවන විට හා එකතැන පල්වනවිට සංඝ සංස්ථාවත් වෙලදපොලකරනය වීම,පල්වීම හා කුනු වීම පුදුම විය යුත්තක් නොවේ.

ජාතිවාදී හා ආගම්වාදී වහසි බස් දොඩන මන්ත්‍රී භික්ෂූන් වනාහි කුනු වී ගිය පොදු සමාජයේම පැතිකඩකි. වෙනෙකක් තබා පාර්ලිමේන්තුවද මිනීමරුවන්ගේ, මත්කුඩු වෙලෙන්දන්ගේ හා අවස්ථාවාදීන්ගේ පල් වලකි. එම ගොහොරුවේ ලගින අරටුව දක්වා කුනු වූ දේශපාලකයින් දැන් දේශපාලනය කරන භික්ෂූන්ගේ පූජනීයභාවය ගැන හදිසියේ කලබලයට පත්ව සිටිති.සමාජය නැමැති ගොහොරුවෙන් පැනනගින නෙලුමක් මෙන් පූජනීය සංඝ සංස්ථාවක් මෙම දේශපාලකයන්ගේ යෝජනා මගින් බිහිවනු ඇතැයි සිතා පොදුජනයාද මඩවල කලත්තන මන්ත්‍රීවරුන් හා මාධ්‍ය ආයතන වෙනුවෙන් විසිල් ගසමින් සිටිති.පාර්ලිමේන්තු යාම මගින් භික්ෂුවගේ ලපූජනීයභාවය ල කෙලෙසේ යැයි කියන්නවුන්ට දීමට ඇත්තේ එක පිලිතුරකි.අමුතුවෙන් කෙලෙසන්නට තරම් පූජනීය කිසිවක් මෙම සමාජ ක්‍රමය විසින් තවදුරටත් ඉතුරු කරනු ලැබ නැත.




# පොත් තුනක් එළි දකියි





ජයලත් මනෝරත්නගේ "දවස තාම තරුණයි" සුගතපාල ද සිල්වා ගේ "වැල්ලට ආ ගැහැනිය" ගුවන් විදුලි නාටක එකතුව හා සිරිල් සී පෙරේරා ගේ "තොටිල්ල පදවන අත" යන කෘති තුන එළිදැක්වීමේ උළෙල මැයි මස 31 වන දින සවස 4 ට කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්වුණි.

ශ්‍රීනාත් මද්දුමගේ විසින් මෙහෙයවන ලද එම උළෙලේ අවස්ථා කීපයකි මේ.

**සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න**

03 8707 4604 / 0402 025 516

**email** sannasanews@gmail.com




මේ ඡන්දය ජනතා අවධානය වෙන පැත්තකට යොමු කිරීමටයි
එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක
ලක්බිම පුවතක්

**අනේ අම්මපා මේ ජනතා අවධානය කියන එක තමුන්නැ හේලගෙ පැත්තට හැරෙන්නෙම නැහැ නොවැ**

තංගල්ලට පැමිණි විට අසන්නට ලැබුණේ නින්දිත තත්ත්වයක්
සියලූ දෙනාම එකට එක්වී සාරධර්ම පිරි රටක් බිහි කරමු ජනපති තංගල්ලේ දී කියයි
දිවයින පුවතක්

**ඔන්න මම නං කට වහගත්තා**
**නෝ කොමෙන්ට්ස්**

දැරියන් දෙදෙනකුට අතවර කළැයි අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සහ නාගරික මන්ත්‍රීවරයකු පොලිස් අත්අඩංගුවේ
දිවයින පුවතක්

**පොලිස් අත්අඩංගුවට අරන්..? අයියෝ මේ මොන පිස්සු වැඩ ද..? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ විනය කමිටුව ඉස්සරහට ගෙනිහින් නඩුව අහලා නිදහස් කරලා දාන්නෙ නැතුව මොනාට මේ පිස්සු වඩ කරනවද මන්දා..**

පාතාල නායකයන් 15ක් දේශපාලනයට ඇවිත්
පුවතක්

**අයියෝ පහළොවක් ද...?**

තාත්තයි පුතයි දෙන්නම එකතුවෙලයි ඔය මගඩි වැඩ කරන්නෙ
ජනපති කියයි
ලංකා සීනිව්ස් පුවතක්

**නෑ නෑ ආචාර්ය සිල්වා කලබල වෙන්ඩ කාරි නෑ..**
**ඒ කතාව කිව්වෙ වෙන කෙනෙකුට..**

කිසිම ජගතෙකුට කුඹුරු ගොඩකරන්න දෙන්නෙ නෑ - නාගරික සංවර්ධන අධිකාරි
සිළුමිණ පුවතක්

**කියවන අය "දේශපාලකයන් හැර" කියන කොටස මුලට දාගන්ඩ**